© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019

| PE0120 (PE720) | අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම<br>THEORY & PRINCIPLES OF EDUCATION |
|---|---|

2019.09.29 පැය 1300 - පැය1600 කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" සහ "ආ" යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:..........................................

### I කොටස

**වඩාත් ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති හිස්තැන් සහිත වරහන තුළ ලියන්න.**

01. පහත සඳහන් අධ්‍යාපන දාර්ශනික අදහස් කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න.

- සෑම ළමයකුට ම කිසියම් වයසක දී නිෂ්පාදන ශ්‍රමය, ඉගෙනීම සහ ක්‍රීඩාව එකට සම්බන්ධ කර ඉගැන්විය යුතු ය.
- ළමයාට සියලු ම නිෂ්පාදන ක්‍රියාවලීන් පිළිබඳ මූලික සිද්ධාන්ත ලබා දීම වැදගත් ය.
- මිනිසා යනු ශ්‍රමය වැය කරන ජීවියෙකි.

මෙම දාර්ශනික අදහස් ඉදිරිපත් කළ දාර්ශනිකයා වන්නේ,

1. මහත්මා ගාන්ධි ය. 2. ජෝන් ඩුවී ය.
3. ප්ලේටෝ ය. 4. කාල් මාක්ස් ය. (........)

අ.පි.බ.

02. පහත සඳහන් අධ්‍යාපන චින්තනය ඇතුළත් කරුණු අතරින් "ජෝන් ඩූවි" ගේ දර්ශනයට වඩාත් සම් වරණය කවරේ ද?

A - සියලු ම පූර්ව නිශ්චිත නිෂ්ඨා ප්‍රතික්ෂේප කිරීම.

B - දැනුම ලබන ප්‍රධාන මාර්ගය ක්‍රියාකාරී අත්දැකීම් ය.

C - නියම මිනිසකු වීමට කය හා මනස එකසේ සංවර්ධනය විය යුතු ය.

1. A, C ය.   2. A, B ය.
3. B, C ය.   4. A, B, C ය. (........)

03. විඥානවාදී දර්ශනය ඉදිරිපත් කළ දාර්ශනිකයා වූයේ,

1. ප්ලේටෝ ය.   2. ක්‍රිෂ්ණමූර්ති ය.
3. රූසෝ ය.   4. රවීන්ද්‍රනාත් තාගෝර් ය. (........)

04. පාසල් අධ්‍යාපනයට සම්බන්ධවීමට පෙර පළමු වසර පහ තුළ දී දරුවා ලබන අධ්‍යාපනය අයත් වන්නේ,

1. විධිමත් අධ්‍යාපනයට ය.   2. අවිධිමත් අධ්‍යාපනයට ය.
3. නොවිධිමත් අධ්‍යාපනයට ය.   4. විවෘත අධ්‍යාපනයට ය. (........)

05. විධිමත් අධ්‍යාපන පද්ධතියෙන් බැහැරව ක්‍රියාත්මක වන කිසියම් තෝරාගත් පිරිසක් වෙනුවෙන් සහ හඳුනා ගත් අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා ලබා දෙන අධ්‍යාපනය,

1. දූරස්ථ අධ්‍යාපනය යි.   2. වැඩිහිටි අධ්‍යාපනය යි.
3. නොවිධිමත් අධ්‍යාපනය යි.   4. විවෘත අධ්‍යාපනය යි. (........)

06. ගෝලීයකරණය කුමක් දැ'යි දැක්වීමට ඉදිරිපත් වූ අදහස් තුනක් පහත දැක්වේ.

A - ජාත්‍යන්තරකරණය යි.

B - ආර්ථික, සංස්කෘතික, දේශපාලන සහ සමාජ ක්‍රියාවලියේ භූගෝලීය සීමා ඉක්මවා සබඳතා පැවැත්වීම යි.

C - ජාතීන් අතර ආර්ථික සම්බන්ධතා රටාවල වර්ධනය හා සංවර්ධනය යි.

ඒ අනුව,

1. A, B, C නිවැරදි ය.   2. A, B නිවැරදි ය.
3. B, C නිවැරදි ය.   4. A, C නිවැරදි ය. (........)

ගුරුවරයා, පාසල හා ප්‍රජාව සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම වඩාත් උචිත වන්නේ,

1. සමාජ ගෞරවය ලබා ගැනීම උදෙසා ය.
2. ප්‍රජාවට නව දැනුම උත්පාදනය සඳහා ය.
3. ප්‍රජාවගේ දියුණුව උදෙසා ය.
4. ප්‍රජාවගේ විශ්වාසය තහවුරු කිරීම උදෙසා ය. (........)

කලක පටන් බොහෝ ලෙස අබලන් ව පැවැති පාසල් වැට ආදි ශිෂ්‍ය සංගමයේ මැදිහත්වීමෙන් පිළිසකර කර දෙන ලදී. මෙයින් ගම්‍ය වන්නේ,

1. පාසලේ භෞතික හා මානව සම්පත් ප්‍රජාවේ ප්‍රගමනයට දක්වන දායකත්වය.
2. පාසලේ හා ප්‍රජාවේ දියුණුවට භෞතික සම්පත් දක්වන දායකත්වය.
3. ප්‍රජාවේ භෞතික හා මානව සම්පත් පාසලේ ප්‍රගමනයට දක්වන දායකත්වය.
4. පාසලේ හා ප්‍රජාවේ මානව සම්පත් ප්‍රශස්ථ ලෙස සංකලනයට දක්වන දායකත්වය. (........)

අ.පි.බ.

09. මෑත කාලීන අධ්‍යාපනයේ ඉතා වැදගත් සංකල්පයක් වී ඇත්තේ තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය යි. 1992 වසරේ ජාතික අධ්‍යාපන කොමිසම් සභාව ඉදිරිපත් කළ පොදු නිපුණතාවල දී තිරසර සංවර්ධන අධ්‍යාපනයට අදාළ නිපුණතාව වන්නේ,

1. ආචාරධර්මවලට අදාළ නිපුණතා
2. පරිසරයට අදාළ නිපුණතා
3. වැඩ ලෝකයට අදාළ නිපුණතා
4. සන්නිවේදනය පිළිබඳ නිපුණතා (........)

10. සංස්කෘතික ප්‍රාග්ධනය හිතකර අන්දමට ශිෂ්‍යයකුට ලැබී ඇති බව පැහැදිලි ව නිරීක්ෂණය කළ හැකි අවස්ථා වඩාත් හොඳින් නිරූපණය වී ඇති පිළිතුර වන්නේ,

1. හැසිරීම, භාෂාව පරිහරණය, ආහාරපාන, ආගම ඇදහීම.
2. හැසිරීම, කථා විලාසය, භාෂාව පරිහරණය, තැනට සුදුසු ඇඳුම් ඇඳීම.
3. හැසිරීම, භාෂාව පරිහරණය, තැනට සුදුසු ඇඳුම් ඇඳීම, ආගම ඇදහීම.
4. හැසිරීම, පානීය ද්‍රව්‍ය, ආගම ඇදහීම, භාෂාව පරිහරණය. (........)

11. අධ්‍යාපනය කෙරෙහි සමාජ පංතිය බලපාන ආකාරය අදහස් **නොවන** පිළිතුර තෝරන්න.

1. දෙමාපිය සාධනය හා සමාජ පංතිය.
2. ශිෂ්‍ය සාධනය හා සමාජ පංතිය.
3. අධ්‍යාපන වියදම් සහ සමාජ පංතිය.
4. පාසල් වර්ග හා සමාජ පංතිය. (........)

12. සමාජානුයෝජනය සඳහා පාසල යොදා ගන්නා ක්‍රමෝපායයන් අතර ඉතා වැදගත් වන්නේ,

1. පාසල් ලාංඡනය
2. පාසලේ පවත්නා සබඳතා
3. පාසල් සිරිත්විරිත්
4. පාසල් විෂයමාලාව (........)

13. සමාජ විද්‍යාත්මක දැනුම ප්‍රයෝගික ව යොදා ගැනීමේ දී ගුරුවරයාට වැදගත් වන ආකාරය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී | A | පවුල් පසුබිම, සමවයස් කණ්ඩායම්, කායික මානසික සම්බන්ධතාව |
| 2. | කළමනාකරණ ක්‍රියාවලියේ දී | B | සමාජ පංතිය, බුද්ධිමය හැකියා, ක්‍රමශිල්ප |
| 3. | ඉගෙනුම් ක්‍රියාවලියේ දී | C | පංති කාමරය, පාසල් පසුබිම, දඩබ්බර සිසුන් මෙහෙයවීම |
| 4. | ප්‍රජා සම්බන්ධතාවල දී | D | ආගමික ආයතන, විවිධ සමිති, සමාජ සේවා ආයතන |

1. B, C, A, D
2. B, A, C, D
3. A, D, B, C
4. B, C, D, A (........)

14. අධ්‍යාපනයේ නව ප්‍රවණතා තුළට ඇතුළත් **නොවන** පිළිතුර තෝරන්න.

1. සමාජ සාධාරණත්වය සඳහා අධ්‍යාපනය.
2. පාසලින් පමණක් ලබා දෙන විධිමත් අධ්‍යාපනය.
3. සමාජ විශිෂ්ටත්වය සඳහා අධ්‍යාපනය.
4. තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය. (........)

අ.පි.බ.

15. සෑම ගුරුවරයකු ම

කළමනාකරුවෙකි, සැලසුම්කරුවෙකි, සංවිධානය කරන්නෙකි, මෙහෙයවන්නෙකි, පාලනය කරන්නෙකි. ඉහත කරුණුවලින් ගම්‍ය වන ගුරු කුසලතාව වන්නේ,

1. විවිධත්වය අගයන කුසලතාව යි. 2. විවිධ සිසුන් සමඟ කටයුතු කිරීමේ හැකියාව යි.
3. ඉගැන්වීමේ කුසලතාව යි. 4. සැලසුම්කරණ හා මෙහෙයවීමේ කුසලතාව යි. (........)

16. වෘත්තිකයකු වශයෙන් කටයුතු කිරීමේ දී ගුරු වෘත්තියට අදාළ සංවර්ධනය කර ගත යුතු ක්ෂේත්‍ර ඇතුළත් පිළිතුර තෝරන්න.

1. දැනුම, ප්‍රායෝගික කුසලතා, ඉගෙනුම් සම්පත්, වෘත්තීය පෞරුෂය
2. දැනුම, වෘත්තීය පෞරුෂය, සමාජ සබඳතා, වෘත්තීය අයිතිවාසිකම්
3. දැනුම, ප්‍රායෝගික කුසලතා, වැටුප, ඉගෙනුම් සම්පත්,
4. දැනුම, සුදුසුකම්, ගුරු පුහුණුව, උසස් පාසලක් (........)

17. ගුරුවරයකු වශයෙන් අධ්‍යාපන සමාජවිද්‍යාව හදාරා තිබීමේ වැදගත්කම කියැවෙන වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

A - පාසල සමාජ සමූහයක් ලෙස හඳුනා ගැනීම.
B - පුද්ගල අන්තර් සබඳතා තේරුම් ගැනීම.
C - ප්‍රාදේශීය වශයෙන් පවතින වෙනස්කම් තේරුම් ගැනීම.
D - ජාතික පොදු අරමුණු පහසුවෙන් තේරුම් ගැනීම.

1. A, C, D 2. B, C, D 3. A, B, D 4. A, B, C (........)

18. ශ්‍රී ලංකාවේ පාසල් තුළ බහුල ව දැකිය හැකි ලක්ෂණයක් වන්නේ තමන් උගන්වන විෂය අනුව ගුරුවරු කණ්ඩායම්වලට බෙදී සිටිමින් තමන් උගන්වන විෂය අනෙක් විෂයන්වලට වඩා උසස් බව පෙන්වීමට ගන්නා ප්‍රයත්නයකි. මෙම අදහසට වඩාත් උචිත ප්‍රකාශය වන්නේ,

1. විධිමත් ආයතනයක් තුළ විධිමත් සබඳතා ගොඩනැගීම යි.
2. විධිමත් ආයතනයන් තුළ අවිධිමත් සබඳතා ගොඩනැගීම යි.
3. අවිධිමත් ආයතනයන් තුළ විධිමත් සබඳතා ගොඩනැගීම යි.
4. අවිධිමත් ආයතනයන් තුළ අවිධිමත් සබඳතා ගොඩනැගීම යි. (........)

19. සංකීර්ණ වෙනසකට යොමු වන 21 වන සියවසේ ඵලදායී ගුරුවරයකු අත් කර ගත යුතු ඉතා වැදගත් පරිපූර්ණතාව කුමක් ද?

1. සන්නිවේදන හැකියාවෙන් යුක්ත වීම. 2. ගැටුම් කළමනාකරණයෙහි නිපුණයකු වීම.
3. ප්‍රත්‍යවේක්ෂණ හැකියාවේ නිපුණයකු වීම. 4. ස්වයං ඉගෙනුමෙහි යෙදෙන්නකු වීම. (........)

20. රටක අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු තීරණය කිරීමේ අවශ්‍යතාව නිවැරදි ව ප්‍රකාශ වන පිළිතුර වන්නේ,

1. අධ්‍යාපන පර්යේෂණ කෙරෙහි අවධානය වැඩි කිරීම.
2. අධ්‍යාපනය පිළිබඳ මහජන ගෞරවය ඇති කිරීම.
3. ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම.
4. ගුරු වෘත්තීය සංවර්ධනය ඉහළ දැමීම. (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0120 (PE720) – අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම

### II කොටස

**"අ"** සහ **"ආ"** යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** **පමණක්** පිළිතුරු සපයන්න.

### "අ" කොටස

01. "අධ්‍යාපනයේ ක්‍රියාකාරී අංශය රඳා පවතින්නේ අධ්‍යාපන දර්ශනය මත ය." මේ පිළිබඳ ඔබේ අවධානය යොමු කරමින්,

(i) අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සබඳතාව නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා සම්පාදනයේ දී වැදගත් වන දාර්ශනික අදහස් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පංති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට වැදගත් වන කාල් මාක්ස් හා ජෝන් ඩූවීගේ දාර්ශනික අදහස් **දෙක** බැගින් දක්වා, ඒවා පංති කාමරයේ දී යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. "විශ්ව පුරවැසියකු බිහි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු ප්‍රබල දායකත්වයක් ලබා දෙයි."

(i) අධ්‍යාපන පරමාර්ථ හා අධ්‍යාපන අරමුණු කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන අරමුණු සකස් කිරීමේ දී සැලකිය යුතු මූලාශ්‍ර **පහක්** **දක්**වන්න. (ලකුණු 05)

(iii) පංති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට සුවිශේෂී අරමුණු හඳුනා ගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

03. "අධ්‍යාපනය ජීවිතයේ එක්තරා කාලයකට පමණක් සීමා වූවක් නොව, එය සමස්ත දිවිය පුරා ම දිවෙන ක්‍රියාවලියකි." ඒ පිළිබඳ අවධානය යොමු කරමින්,

(i) යාවජීව අධ්‍යාපන සංකල්පය හඳුන්වන්න. (ලකුණු 03)

(ii) යාවජීව අධ්‍යාපනයේ අරමුණු **පහක්** ලියන්න. (ලකුණු 05)

(iii) ගෝලීය සමාජයක සාර්ථකත්වය සඳහා ගුරුවරයකුට යාවජීව අධ්‍යාපනය ඵලදායී වන අවස්ථා **හතරක්** විමර්ශනය කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

04\. "පරම්පරාවෙන් පරම්පරාවට දැනුම, ආකල්ප, කුසලතා සම්ප්‍රේෂණය කරන්නේ ගුරුවරයා ය". ඉහත ප්‍රකාශය අවධාරණය කරමින්,

(i) වෙනස් වන සමාජ සන්දර්භයට අනුගත වන ඵලදායී ගුරුවරයකුගේ ලක්ෂණ **හයක්** පෙන්වා දෙන්න. (ලකුණු 03)

(ii) ඵලදායී ගුරුවරයකු ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ පරිචයක් ලබා ගැනීමටත්, ස්වයං ඉගෙනුමෙහි යෙදමින් යාවත්කාලීන වීමටත් ප්‍රායෝගික ව අවශ්‍ය වන ඉගෙනුම් ක්ෂේත්‍ර **දෙකක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ඵලදායී ගුරුවරයකු ලෙස පාසලේ දී ඔබට ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති **දෙකක්** යෝජනා කර, එයින් ගුරු වෘත්තීය පෞරුෂය ඔප්නංවා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

## **"ආ" කොටස**

05\. (i) බහු සංස්කෘතික අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) ගෝලීය සංස්කෘතියකට උචිත විශ්වීය පුරවැසියකු තැනීමට යාමේ දී ශිෂ්‍යයා මුහුණ පාන අභියෝග **දෙකක්** දක්වා, ඒවා ජය ගැනීමේ උපාය මාර්ග කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) පංති කාමරය තුළ විධිමත් සමූහ සබඳතා ගොඩනගා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කරගනු වස් ගුරුවරයකුට බහු සංස්කෘතික අධ්‍යාපනය වැදගත් වන ආකාරය කරුණු **හතරක්** ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 08)

06\. (i) සමාජ ස්ථරායනය පිළිබඳ ඉදිරිපත් වී ඇති ප්‍රධාන න්‍යායන් අතරින් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) සමාජ සචලතාව කෙරෙහි බලපාන සාධක **හතරක්** දක්වා, ඉන් එක් සාධකයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් ලියන්න. (ලකුණු 05)

(iii) සමාජ පංතිය යන්න විග්‍රහ කර, එය අධ්‍යාපනයට බලපාන ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 08)

07\. (i) ගුරු භූමිකාවේ ලක්ෂණ සැලකිල්ලට ගනිමින් ගුරු භූමිකාව පිළිබඳ නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 03)

(ii) ගුරුවරයාට වෘත්තීය සංවර්ධනයේ දී වැදගත් වන ගුරු ආචාරධර්ම ඇතුළත් යෝජනා **තුනක්** ඉදිරිපත් කර, ඒවායෙහි කාලීන වටිනාකම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) ගුරු භූමිකාවේ ස්වභාවය තීරණය වන සමාජයීය සාධක **දෙකක්** දක්වා, එම සාධක ගුරු භූමිකාවේ තත්ත්වය නඟා සිටුවීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

08\. (i) සමාජානුයෝජනය යන්න අර්ථ දැක්වීම සඳහා නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 03)

(ii) සමාජානුයෝගී ක්‍රමශිල්ප **තුනක්** දක්වා, ඒ පිළිබඳ අවබෝධය ගුරුවරයාට වැදගත් වන ආකාරය පෙන්වා දෙක්න. (ලකුණු 05)

(iii) සමාජානුයෝගී කාරක **හතරක්** නම් කර, ඉන් **එකක්** ගුරුවරයකුගේ දෛනික ක්‍රියාවලිය අර්ථවත් කිරීමට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

********